# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015
## Primary Piriven Year End Term Test - 2015
### 3 වසර / Grade 3

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved)

**ඉතිහාසය**
**History**

කාලය : පැය 03 යි.
Time : Three hours.

I කොටසේ ප්‍රශ්න සියල්ලටත්, II වන කොටසින් තෝරා ගත් ප්‍රශ්න 04 කටත් පිළිතුරු සපයන්න.

<u>I කොටස.</u>

(01) නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. ශ්‍රී ලංකාව පිහිටියේ සාගරයේ ය.

..........................................................................................................

ii. මානවම්ම රජු පූජා කළ පිරිවෙන,

..........................................................................................................

iii. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,

..........................................................................................................

iv. ලංකාවේ ප්‍රධානතම ඓතිහාසික වංශ කථාව,

..........................................................................................................

v. කෝට්ටේ යුගයේ සාහිත්‍ය උන්නතිය උදෙසා ක්‍රියා කළ රජු.

..........................................................................................................

vi. කෝට්ටේ යුගයේ දී "ෂඩ් භාෂා පරමේෂ්වර" යන නාමයෙන් හැඳින් වූ මහා පඬිවරයාණෝ,

..........................................................................................................

vii. මහා බෝධි සමාගම ආරම්භ කරනු ලැබුවේ,

..........................................................................................................

viii. ක්‍රි.ව.1943 වර්ෂයේ දී පිරිවෙන් උපදේශක සභාවක් පත් කළ අධ්‍යාපන ඇමතිවරයා,

..........................................................................................................

ix. කූඤ්ඤ අක්ෂර භාවිත කළ ශිෂ්ටාචාරය,

..........................................................................................................

x. පිරමිඩ නිර්මාණය කළ ශිෂ්ටාචාරය,

..........................................................................................................

xi. "චීනයේ ඛේදවාචකය" නමින් හඳුන්වන ගංගාව,

.................................................................................

xii. කොම්පියුසස් තුමා ජීවත් වූයේ,

.................................................................................

xiii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ගොඩනැගුණු ගංගාව,

.................................................................................

xiv. මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වන ගංගාවකි,

.................................................................................

xv. ලංකාවට පැමිණි ප්‍රථම ආර්ය කණ්ඩායමේ නායකයා වූයේ,

.................................................................................

xvi. දළදා වහන්සේ මෙරටට වැඩම කරවන ලද්දේ කිනම් රජු දවසේ ද?

.................................................................................

xvii. දුටුගැමුණු කුමරුගේ පියා,

.................................................................................

xviii. අනුරාධපුරය අගනුවර ලෙස තෝරා ගත් ප්‍රථම රජු,

.................................................................................

xix. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ රාජ්‍ය සමය,

.................................................................................

xx. ලම්බකරණ වංශයේ ආරම්භක රජතුමා,

.................................................................................

(වළගම්බා රජු, කාවන්තිස්ස රජු, පණ්ඩුකාභය රජු, කිත්සිරිමෙවන්, විජය කුමරු, වළවේ ගඟ, සින්දු ගඟ, ඉන්දියන්, උත්තරෝල්භ, මහා වංශය, මෙසපොතේමියාව, නයිල් නිම්න, සී.ඩබ්ලිව්. ඩබ්ලිව්.කන්නන්ගර මහතා, අනගාරික ධර්මපාල තුමා, තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, **vi** පරාක්‍රම බාහු රජු, චීනය, හොවැං හෝ ගඟ,නිල් මානෙල් මල, වසභ )

( ලකුණු 02 x 20 = 40 )

## II කොටස.

(02) i. අනුරාධපුර යුගයේ දී "මූල"නමින් හැඳින් වූ භික්ෂු ගුරු කුළ පොළොන්නරු යුගයේ දී හැඳින් වූවේ කෙසේ ද?

ii. අනුරාධපුර යුගයේ පිරිවෙන් අධ්‍යාපනයේ මූලික අරමුණු පැහැදිලි කරන්න.

iii. වැලිවිට සංඝරාජ ස්වාමීන් වහන්සේ විසින් ශාසනයේ දියුණුවට ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳව කෙටි විස්තරයක් දක්වන්න.

( ලකුණු 4+5+6 = 15 )

(03) i. කෝට්ටේ යුගයේ වැඩ සිටි පඬිවරු දෙදෙනෙක් නම් කරන්න.

ii. කෝට්ටේ යුගයේ පැවති ජනප්‍රිය පිරිවෙන් දෙකක් සඳහන් කරන්න.

iii. කෝට්ටේ යුගයේ පැවති පිරිවෙන්වල අධ්‍යාපන පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

( ලකුණු 4+5+6 = 15 )

(04) i. මෑත දී ආරම්භ කරන ලද විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන් හි ආරම්භක කතුවරුන් සඳහන් කරන්න.

ii. යටත් විජිත සමයේ මෙරට බෞද්ධ පාසල් පිහිටුවීමේ ව්‍යාපාරයේ පුරෝගාමීන් ලෙස ක්‍රියා කළ පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.

iii. වර්තමාන ලංකාවේ ක්‍රියාත්මක වන පිරිවෙන් වර්ග දක්වා එහි විෂය අන්තර්ගතය සඳහන් කරන්න.

( ලකුණු 4+5+6 = 15 )

(05) i. ලෝකයේ පැරණිම නීති පද්ධතිය දක්නට ලැබෙන ශිෂ්ටාචාරය දක්වන්න.

ii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිළිබඳව පර්යේෂණ කළ විද්‍යාඥයින් දෙදෙනෙකු දක්වන්න.

iii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙහි නාගරික ලක්ෂණ පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

( ලකුණු 4+5+6 = 15 )

(06) i. චීන මහා ප්‍රාකාරය කරවන ලද රාජ්‍ය වංශය දක්වන්න.

ii. චීනයේ දක්නට ලැබෙන ප්‍රධාන ආගම් 03 ලියන්න.

iii. නයිල් නිම්න ශිෂ්ටාචාරය පිළිබඳව පහත වචන හඳුන්වන්න.

   i. රේ
   ii. මෙම්පිස්
   iii. ඔසිරියස්

( ලකුණු 4+5+6 = 15 )

(07) i. ඉතිහාසය යන්න පිළිබඳ නිර්වචනයක් ලියන්න.

ii. පෙරදිග රටවල ජනයා අතීත ශ්‍රී ලංකාව හැඳින් වූ නම් දෙකක් ලියන්න.

iii. ලංකාව ඉන්දියාවේ සමීපයේ පිහිටා තිබීම නිසා සිදු වූ බලපෑම් කෙටියෙන් විස්තර කරන්න.

( ලකුණු 4+5+6 = 15 )

(08) i. අතීතයේ ලංකාවේ ජීවත් වූ ජන වර්ග දෙකක් නම් කරන්න.

ii. සීගිරිය රාජධානියක් වශයෙන් තෝරා ගත් රජු සහ ඔහුගේ පියාගේ නම් පිළිවෙලින් සඳහන් කරන්න.

iii. මහින්දාගමනයෙන් අප ලද දායාද පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

( ලකුණු 4+5+6 = 15 )